# නාට්‍ය හා රංගකලාව

## 07 ශ්‍රේණිය - දෙවන වාරය

## පළමු පාඩම

## විද්‍යුත් මාධ්‍යයෙන් දකින වේදිකා නාට්‍ය

- අපට හමුවන කලාවන් දෘෂ්‍ය කලා මාධ්‍ය, ශ්‍රව්‍ය කලා මාධ්‍ය හා ශ්‍රව්‍ය-දෘෂ්‍ය කලා මාධ්‍ය ලෙස නම් කළ හැකි ය. ඒවා අතර චිත්‍ර, මූර්ති, කැටයම්, මෝස්තර දෘෂ්‍ය කලා වන අතර ගුවන් විදුලිය ශ්‍රව්‍ය මාධ්‍යයකි. රූපවාහිනිය හා සිනමාව ශ්‍රව්‍ය දෘෂ්‍ය නැතහොත් රූප හා ශබ්ද දෙකෙන් ම සමන්විත මාධ්‍යයක් වශයෙන් සැලකේ.
- මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය ලෙසින් ද ජන මාධ්‍ය කොටස් දෙකක් ඇති අතර පුවත්පත්, පොත්පත් ආදිය මුද්‍රිත මාධ්‍ය වේ. රූපවාහිනිය, ගුවන්විදුලිය, අන්තර්ජාල සමාජ මාධ්‍ය ආදිය සැලකෙන්නේ විද්‍යුත් මාධ්‍ය ලෙයසි
- එම එක් මාධ්‍යයකින් අනෙක් මාධ්‍යය එකිනෙකට වෙනස් ය. ඒවාට සම්බන්ධ වන තාක්ෂණික ශිල්පීන්, කලා කරුවන්, භාවිත කරන උපකරණ, ස්ථාන ආදිය පවා එකිනෙකට වෙන්ස් ය. නිදසුනක් ලෙස රූපවාහිනිය විවිධ ස්ථානවල සිට වීඩියෝ කැමරා යොදා ගනිමින් පටිගත කිරීම් සිදු වෙයි. ගුවන්විදුලිය ශබ්දාගාර තුළ සිට ශබ්ද පටිගත කිරීම සිදු කරයි.
- වේදිකා නාට්‍යයක තිබෙන සජීවී ගුණය, රූපවාහිනී ප්‍රදර්ශනයකදී දැකිය නොහැකි ය. සංයුක්ත තැටියකින් නරඹන වේදිකා නාට්‍යයකින් ලැබිය හැකි වන්නේ ද සැබෑ නාට්‍යමය රස වින්දනය නොවේ. එමගින් දැකිය හැකි වන්නේ සමස්ත නාට්‍යමය අත්දැකීම නොව කැමරාකරුගේ දෘෂ්ටි කෝණ මගින් යොමුකරවන දර්ශන පමණකි. වේදිකා නාට්‍යයක් මුල සිට අග දක්වා අඛණ්ඩව නැරඹිය යුතු වේ. එහෙත් රූපවාහිනී නාට්‍යයක් ප්‍රදර්ශනය වන්නේ කොටස් වශයෙනි.
- මෙසේ රූපවාහිනිය ඇතුළු විවිධ විද්‍යුත් මාධ්‍යයන්ගෙන් විකාශනය වන නාට්‍ය වර්ග හේතුවෙන්, වේදිකා නාට්‍යයක විශේෂ ලක්ෂණ හඳුනාගැනීම පහසු වේ. ඇතැම්විට වේදිකා නාට්‍ය පළිබඳ විශේෂ වැඩසටහන් රූපවාහිනී මාධ්‍යයෙන් විකාශනය වේ. 'රංග භූමි' 'ඇහැට කනට' 'ආයුබෝවන්' වැනි වැඩ සටහන්වල දී මෙන් ම වේදිකා නාට්‍ය කොටස් වශයෙන් ද ප්‍රදර්ශනය කරනු ලැබේ. වේදිකා නාට්‍යයක සාර්ථකත්වය උදෙසා විවිධ ජන මාධ්‍යයන්ගෙන් මහත් පිටිවහලක් ලැබේ.

### අභ්‍යාස

01. ජනසන්නිවේදන මාධ්‍යය නම් කරන්න.
02. ඒ ඒ ප්‍රභේදයන්ගේ සුවිශේෂතා 2 බැගින් ලියන්න.
03. ටෙලි නාට්‍යය හා වේදිකා නාට්‍යය අතර වෙනස්කම් 4ක් ලියන්න.
04. රූපවාහිනී මාධ්‍යය තුළ විකාශය වන නාට්‍ය වැඩසටහන් මොනවාද?